# ලංසු සඳහා ආරාධනයයි. (IFB)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
## මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය (MOMDE)
## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා GPS Iridium Radio Collars 40 ක් සැපයීම හා ගෙනැවිත් භාරදීම.

**ණය අංකය : 5792 - LK**

**කොන්ත්‍රාත් අංකය : ESCAMP/DWC/20822/GO/RFB**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය හි (ESCAMP) පිරිවැය අරභයා ලෝක බැංකුවෙන්, ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය මුදලේ ලැබීම්වලින් කොටසක්, "වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා, අතිරේක උපකරණද සමඟ GPS ඉරිඩියම් රේඩියෝ කොලර් (විකිරණශීලි කරපටි) හතලිහක් (40) ක් සැපයීම හා ගෙනැවිත් භාරදීම" සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ එන යෝග්‍ය ගෙවීම් සඳහා යෙදවීමට අදහස් කෙරේ.

2. මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා GPS Iridium Radio Collars හතලිහක් (40) ක් සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා, යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් සැපයුම්කරුවන් වෙතින්, මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

3. ටෙන්ඩර්කරුවෙකු වෙනුවෙන් සහ සඳහා නම්කරනලද අයෙකු හෝ නියෝජිතවරයෙකු, හෝ උප ඒජන්තවරයෙකු හෝ ඒජන්තවරයෙකු ලෙස, ටෙන්ඩර් සඳහා අයදුම්කරනු ලැබීමට පෙර, ශ්‍රී ලංකාවේ. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත්තු පනත යටතේ. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව හා සමඟ ලියාපදිංචි විය යුතුය.

4. ලංසුකරණය, **2014 ජූලි මස** සංශෝධනය කරන ලද **2011 ජනවාරි** මස පනවන ලද, ලෝක **බැංකුවේ ණය ගැනුම්කරුවන් විසින්** IBRD **ණය සහ** IDA **ණය හා ප්‍රදාන යටතේ. ලෝක බැංකුවේ, මාර්ගෝපදේශ භාණ්ඩ ප්‍රසම්පාදනය, කාර්ය කටයුතු, සහ උපදේශන නොවන සේවා** සඳහා උපදෙස් හි නිශ්චිතව දක්වා ඇති පරිදි, ජාත්‍යන්තර තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටි මගින් සිදුකරනු ලබන අතර, එම ලංසුකරණය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හි අර්ථ නිරූපනය කර ඇති පරිදි සියලු යෝග්‍යතා පූර්ණ, සුදුසුකම්ලත් ලංසුකරුවන් හට විවෘතය. එයට අමතරව, බැඳියා පිළිගැටුම් පිළිබඳ ලෝක බැංකුවේ ප්‍රතිපත්තිය තුළ පැහැදිළිව සඳහන් කර ඇති හා ඉදිරිපත් කර ඇති, 1.6 සහ 1.7 ඡේද විමසා බලන්න.

5. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට, වැඩිදුර තොරතුරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය හි (ESCAMP), හි, ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන පහත සඳහන් ලිපිනයේදී, 2017-11-20 වන දින දක්වා, කාර්යාල වේලාවන් තුළ, පැය 09.00 සිට පැය 11.00 දක්වා අතරතුර, නොමිලේ පරීක්ෂා කරබැලිය හැකිය.

6. අභිලාෂී, යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලං.රු. (LKR) 5,000.00 (පන්දහසක) ගාස්තුවක් ගෙවීමෙන් හා පහත දක්වෙන ලිපිනයට, ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය, මුදලින්, ESCAMP (පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය) හි ගණකාධිකාරී වෙත ගෙවීම වනු ඇත.

7. අනු පිටපතකින් යුක්තව, මුද්‍රා තබන ලද ලංසු ("මුල්පිටපත" හා "අනුපිටපත" වෙන වෙනම), 2017-11-21 වන දින පැය 10.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ, පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. විද්‍යුත් ක්‍රමයට එවනු ලබන ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවසර දෙනු නොලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත්, නම්කරන ලද නියෝජිතයින් ඉදිරියේදී ප්‍රසිද්ධියේ බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 82 හි "සම්පත් පාය" හි, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) හි ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

8. පූර්ව ලංසු රැස්වීමක්, 2017-10-30 වන දින පැය 10.00ට, බත්තරමුල්ල, කොස්වත්ත, තලංගම උතුර, හොරගහකන්ද පටුමගේ, අංක 363/Eහි, පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) හි, කාර්යාලයේදී පැවැත්වේ.

9. සියලුම ලංසු සමඟ, ඇමෙරිකන් (US) ඩොලර් 6,400.00 ක වටිනාකමට වන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් බැංකු ඇපකරය "තහවුරුකර ඇති", වෙනත් රටක පාදකව ඇති බැංකුවකින් හෝ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද "ලංසු සුරක්ෂණයක්" (ඇපකරයක්), ඉදිරිපත් කළ යුතුය.

10. සාර්ථක ලංසුකරු / ලංසුකරුගේ දේශීය ඒජන්ත / නියෝජිතවරයා, ශ්‍රී ලංකාවේ, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRC) හා සමඟ ලියාපදිංචි වී සිටිය යුතු හෝ ලියාපදිංචි විය / ලියාපදිංචිය සහිත විය යුතුය.

11. සියලුම ලංසු හෝ ලංසුවලින් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය. තවද, ඒ පිළිබඳ සියලුම අයිතින් ඔවුන් සතුය.


**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය,**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,**
**අංක : 363/E, හොරගහකන්ද පටුමග,**
**කොස්වත්ත, තලංගම උතුර,**
**බත්තරමුල්ල,**
**ශ්‍රී ලංකාව.**

**දුරකථන : +94 011-3355589,**
**ෆැක්ස් : +94 011-2791278**
**වෙබ් අඩවිය : www.environmentmin.gov.lk**
**ඊමේල් ලිපිනය : meharsinghelaxana@gmail.com**


**2017.10.09**